www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# චීනයේ 30 වසරක වෙළඳපොළ ප්‍රතිසංස්කරන සැමරීමට තුරුඟොස නොනැගේ

## No fanfare to mark 30 years of China's market reform

**ජෝන් චාන් විසිනි**
**2009 ජනවාරි 14**

චීනයේ වෙලඳපොල ප්‍රතිසංස්කරන ඇරඹීමේ 30 වැනි සංවත්සරය පසු ගිය මාසයට යෙදී තිබුනු නමුදු, ඒ වෙනුවෙන් මහත් තුරුගොසක් නොනැඟුනි. සත්තකින් ම චීන කොමියුනිස්ට් පක්ෂයට (සීසීපීයට) උපහාර පිදීමට තරම් වන කිසිවක් ඇත්තේ නැත. අඛන්ඩ ආර්ථික උත්පාතයක් කෙරේ එයට තිබූ අපේක්ෂාවන් හා ධනේශ්වර වෙලඳ පොලෙහි හාස්කම කෙරේ වූ දැඩි විශ්වාසය වේගයෙන් ක්ෂය වෙමින් පවතී.

පසුගිය අගෝස්තුවේ බීජිං නගරය එක්සත් ජනපද ඩොලර් බිලියන 43ක් තරම් වන විශ්මය දනවන මුදලක් වැය කරමින් ඔලිම්පික් ක්‍රීඩා උලෙල පැවැත්වී ය. ලෝක වේදිකාව මත චීන ධනවාදයේ සම්ප්‍රාප්තිය ප්‍රදර්ශනය කිරීම සඳහා එය මේ අවස්ථාව ප්‍රයෝජනයට ගත්තේ ය. ඊට මසකට පසුව, ගෝලීය මූල්‍ය සුනාමිය චීනය පුරා ගලායෑම ඇරඹිනි. චීන නිර්යාත සඳහා ප්‍රධාන වෙලඳපොලවල් වන එක්සත් ජනපදය, ජපානය හා යුරෝපය යන රටවල් සියල්ල ආර්ථික පසුබෑමකට ඇද වැටෙත්ම වර්ධනය පිලිබඳ දත්ත එක පිට එක පහත හෙලීම ආරම්භ විය. සේවා වියුක්තිය පිපිරෙන සුලු තත්වයකට පැමිනීම වැලැක්වීම සඳහා අවශ්‍ය ආර්ථික වර්ධනයේ මට්ටම පොදුවේ සැලකෙනුයේ සියයට 8ක් ලෙසයි. 2009 වසරේ වර්ධනය මේ මට්ටමට වඩා බෙහෙවින් පහත වැටෙනු ඇතැයි බොහෝ විශ්ලේෂකයෝ අනාවැකි පලකරති.

30 වසරක වෙලඳපොල ප්‍රතිසංස්කරන පිලිබඳ නිල සමරු උලෙල පැවතියේ දෙසැම්බර් 18 වැනි දා මහජන රැස්වීම් ශාලාවෙහි දී ය. 1978 දෙසැම්බර් 18 වනාහී සීසීපී නායක ඩෙං ෂියා ඕපිංගේ ආර්ථික සැලසුම් විධිමත් ලෙස පිලිගත් දිනයයි. රැස්ව සිටි නිලධාරින් 6,000ක් අමතමින් ජනාධිපති හූ ජින්ටාවෝ ඉදිරිපත් කලේ අනාගතය පිලිබඳව සිත් කලකිරවන තක්සේරුවකි. පක්ෂයේ ඉහල ම ප්‍රමුඛතාව විය යුත්තේ සමාජ ස්ථායිතාවයයි ඔහු ප්‍රකාශ කලේ ය. "ස්ථායීතාව නොමැතිව කිසිවක් මුදුන්පත් කර ගත නොහැක. අප ලබා ඇති ජයග්‍රහනයන් අපට අහිමි වනු ඇත"යි ද ඔහු අනතුරු ඇඟවී ය.

සේවා වියුක්තියෙහි හා දුගී බවෙහි මට්ටම් නැගෙත් ම සියලු ආකාරයේ විරෝධතාවන්ට හා විරසකයන්ට එරෙහිව පොලිස් රාජ්‍ය පියවර තීව්‍ර කිරීමට කල කැඳවීමක් ලෙස මේ දේශනය අර්ථකථනය කල හැකිය. සීසීපීය "බටහිර දේශපාලන පද්ධතිය අනුකරනය නොකරනු ඇත"යි පවසමින හූ සිය පනිවිඩය ප්‍රතිසාධනය කලේ ය. වෙනත් වචනවලින් කියතොත්, ඉතාමත් සීමිත පරිමානයක වුව ද, ප්‍රජාතන්ත්‍රීය අයිතීන් පිරිනැමීමක් නොකෙරෙනු ඇත.

ඉන් තෙදිනකට පසුව, අගමැති වෙන්ජියා බාවෝ ගුවන් ගමන් හා අභ්‍යවකාශ තරන විද්‍යාව පිලිබඳ බීජිං විශ්වවිද්‍යාලය වෙත කලින් නිවේදනය නොකල සංචාරයකට එක් විය. එහි දී රැකියා හිඟය පිලිබඳ ශිෂ්‍යයින් අතර පුලුල් ලෙස පැතිරුනු සැක සාංකා දුරලීමට ඔහු ප්‍රයත්නයක් දැරී ය. "ශිෂ්‍යයිනි, කරුනාකර සන්සුන්ව සිටින්න. උපාධිධාරී සේවා නියුක්තිය පිලිබඳ ගැටලුවට අපි මුල් තැන දෙන්නෙමු"යි ඔහු පොරොන්දු විය. ආන්ඩුව ප්‍රශ්න දෙකක් සම්බන්ධයෙන් කනස්සල්ලෙන් පසුවන බව ඔහු පිලිගත්තේ ය. "එකක් නම්, සිය ගම්පලාත් බලා ආපසු පැමිනෙන සංක්‍රමනික කම්කරුවන් පිලිබඳ ප්‍රශ්නයයි. අනික, උපාධිධාරී සේවා නියුක්තිය පිලිබඳ ප්‍රශ්නය යි."

2008 වසරෙහි දී විශ්වවිද්‍යාල උපාධිධාරීන් මිලියන 1.5ක් විරැකියාවෙන් පසුවූ බව නිල සංඛ්‍යා ලේඛන පෙන්නුම් කරති. 2009 වසරෙහි දී නව විශ්වවිද්‍යාල උපාධිධාරීන් වාර්තාගත සංඛ්‍යාවක් වන මිලියන 1.6 ද, කලින් වසරවල සේවාවියුක්තිකයන් ද ඇතුලුව, රැකියා සොයා යන මුලු උපාධිධාරීන් සංඛ්‍යාව මිලියන 10ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 1989 වසරෙහි දී දිගින් දිගටම පැවති ශිෂ්‍ය පෙලපාලි සමඟ කම්කරුවන් තමන්ගේ වඩාත්ම රැඩිකල් සමාජ ඉල්ලීම් ද සහිතව ඒකාබද්ධ වූ බැව් සීසීපීය ඉතාමත් හොඳින් අවබෝධ කර ගෙන ඇත.

සමාජ කැලඹිලි පිලිබඳ ඇතිවී තිබෙන බිය පසුගිය සතියේ නිකුත්වූ නිල අවුට්ලුක් සඟරාවෙන්

ප්‍රකාශ විය. "දැන් අපි පොදු ජන ක්‍රියාකාරකම් (එනම්, විශාල පරිමානයේ විරෝධතා) ඇති වන උච්චතම කාල පරිච්ඡෙþදයකට ඇතුලු වෙමින් සිටිමු"ය යි එම සඟරාව අනතුරු ඇඟවී ය. "2009 වසරෙහි දී චීන සමාජයට වඩාත් ගැටලු සහගත හැලහැප්පීම්වලට මුහුන දීමට සිදු විය හැකිය. ඒවා, පක්ෂයේ හා ආන්ඩුවේ සියලු ස්තරයන්ගේ පාලන හැකියාවන් වඩාත් ප්‍රබල ලෙස උරගා බලනු ඇත."

2009 වසරෙහි දී ආන්ඩුවට සියයට 8ක ආර්ථික වර්ධනයක් පවත්වා ගත හැකි වුවහොත් එතුලින් යන්තමින් රැකියා මිලියන 8ක් නිර්මානය කෙරෙනු ඇතැයි සඟරාව සටහන් කලේ ය. මෙය විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ට යන්තමින් සරිලන රැකියා ප්‍රමානයකි. " සමාජීය ගැටුම් දැනටමත් යම් ජනතාවාදී පදනමක් සකස් කර ඇත. මේ අනුව, යෝග්‍ය විලායකයක් තිබුනු විගස, එය වේගයෙන් පුපුරා ගොස් ගැටුම් වේගයෙන් වර්ධනය වේ ය"යි එහි ප්‍රකාශවිනි.

එසේ වුවද, 30 වසරක වෙළඳපොල ප්‍රතිසංස්කරන සම්බන්ධයෙන් කිසිදු උත්සවයක් නොමැති වීමෙන් පිලිබිඹු වූයේ සමාජ කැලඹීම් පිලිබඳ හුදු භීතිය පමනක් නොවේ. ගෝලීය ආර්ථික පිරිහීම රාජ්‍ය තන්ත්‍රයේ සාමාජිකත්වය තුල ප්‍රගාඪ දෘෂ්ටිමය අර්බුදයක් ද ජනිත කරයි. බටහිර රටවල සමාන තනතුරු දරන්නවුන් මෙන්ම සීසීපීයේ නිලධාරින් ද සිය ආර්ථික ප්‍රතිපත්ති පදනම් කොට ඇත්තේ මුලුමනින්ම පාහේ ධනේශ්වර වෙළඳපොල මත අන්ධ විශ්වාසය තබමිනි. මෙම වෙළඳපොල දැන් 1930 ගනන්වලට පසුව දැවැන්ත ම ආර්ථික කැලඹීම් ජනිත කොට ඇත.

1949 වසරෙහි දී ස්ථාපිත කරන ලද සීසීපී තන්ත්‍රය කිසි දිනෙක සමාජවාදී හෝ කොමියුනිස්ට් තන්ත්‍රයක් නොවී ය. මාඕ "තනි රටෙහි සමාජවාදය" නමැති ප්‍රතිගාමී ස්ටැලින්වාදී මනෝරාජ්‍ය තමන්ගේ ම ගොවි රැඩිකල්වාදී වර්ගය සමග සංයෝජනය කලේ ය. එතුලින් 1950 ගනන්වල හා 1960 ගනන්වල ආර්ථික ව්‍යසනයන් පෙලක් ජනිත කෙරුනි. 1971 වසරෙහි දී වොෂිංටනය සමග සුහද සබඳකම් යලි පිහිටුවා ගැනීම, ගොවීන් මත පදනම්වූ සමාජවාදය පිලිබඳ මාඕගේ සම්පරීක්ෂනවල අවසානය ද, "ධනේශ්වර මාර්ගය ගන්නන්ගේ" ආරෝහනය ද සලකුනු කලේ ය. එහි කූට ප්‍රාප්තිය වූයේ 1978 වසරෙහි දී ඩෙං පක්ෂ නායකයා වශයෙන් පදවි ප්‍රාප්ත වීමයි.

1960 ගනන්වල දී හා 1970 ගනන්වල දී, ඩෙං, "අංක 2 ධනේශ්වර මාර්ගය ගන්නා" ලෙස මාඕ විසින් හංවඩු ගසන ලදී ඩෙං නියෝජනය කලේ නිලධාරි තන්ත්‍රයෙහි වඩාත් වරප්‍රසාද ලත් කොටස් පමනක් නොව, කලින් සිටි ධනපති පන්තියත් විදේශගත චීන ධනේශ්වරයත් ය. ඔහුගේ ආර්ථික "ප්‍රතිසංස්කරන" විදේශ ප්‍රාග්ධනය චීනය තුලට යලි ඇතුලු වීම සඳහා වාන් දොරටු විවර කිරීමක් විය. මෙය 1970 ගනන්වල දී මාඕ යටතේ ද ඔහුගේ අනුප්‍රාප්තික හුවා ගුවෝෆෙං යටතේ ද සීමිත ප්‍රමානයකට ඇරඹුනු ප්‍රවනතාවකි.

ධනේශ්වරයට පක්ෂපාතී සිය ප්‍රතිපත්ති සාධාරනීකරනය කිරීම සඳහා ඩෙංට තන්ත්‍රය විසින් කලින් භාවිතා කල විප්ලවකාරී මැත දෙඩවිලි අත්හැර දමන්නට සිදු විය "යුද්ධය හා විප්ලවය" පිලිබඳ සීසීපීයේ සම්ප්‍රදායික සටන්පාඨ වෙනුවට ඩෙං ජාත්‍යන්තර " සාමය හා සංවර්ධනය" පිලිබඳ පර්යාලෝකයක් ඉදිරිපත් කලේ ය. ධනේශ්වර කඩාවැටීම පිලිබඳ මාක්ස්වාදී න්‍යාය යල් පැන ගිය එකක් බවට සීසීපීයේ නායකත්වය දරන මතය මේ දැක්ම සම්පින්ඩනය කර දැක්වී ය.

ලෝක ධනේශ්වරය සිය විසංවාද ජයගෙන ඇති බවටත් නව ලෝක යුද්ධයක අනතුර හීන වන බවටත් නිගමනය කිරීම සඳහා දෙවැනි ලෝක සංග්‍රාමයෙන් පසුව ඇති වූ උත්පාතයත් අන්තර්-අධිරාජ්‍යවාදී ගැටුම් නොමැති වීමත් ඩෙං පෙන්නුම් කලේ ය. චීනයට ගෝලීය ධනේශ්වර පද්ධතිය තුලට ඒකාග්‍ර වීම සඳහා එවැනි පරිසරයක් වාසිදායක කොන්දේසි සපයනු ඇත.

වෙළඳපොල ප්‍රතිසංස්කරනයෙහි නිර්මාපකයෙකු වශයෙන් ඩෙං පිලිගැනෙන අතර ඔහුගේ ප්‍රවේශය තනිකර ම ප්‍රයෝජ්‍යතාවාදී විය. "ගල් ස්පර්ශ කරමින් ගඟ තරනය කරන්න" යන ඔහුගේ සටන් පාඨයෙන් එය සම්පින්ඩනය කෙරේ. වෙනත් වචනවලින් කියතොත්, නිර්මාපකයාට විශිෂ්ට සැලසුමක් හෝ දල සටහනක් නොතිබුනි. ඩෙංගේ ඉදිරි ගමන, ධනේශ්වර පද්ධතියෙහි ක්‍රියාකාරිත්වය පිලිබඳ අන්ධව විශ්වාසය තබමින්, සරල ආකාරයෙන් අතපතගා යෑමක් විය. ඔහුගේ ප්‍රයත්නයන්, නිෂ්පාදක ක්‍රියාවලියන් හි ගෝලීය කරනය පෙලඹවූ පශ්චාත්-යුද උත්පාතයෙහි අවසානය හා සම්පාත විය. පහත වැටෙන ලාභ අනුපාතිකයන් හිලව් කිරීමට මං සොයමින් සිටි ප්‍රධාන සංස්ථාවනට, චීනය සුගම ශ්‍රමය ලබාදෙන අති විශාල උල්පතක් ප්‍රදානය කලේ ය.

ඩෙංගේ ආකෘතීන් "ආසියානු කොටි" වශයෙන් හැඳින්වෙන රටවල් විය. එනම්, කම්කරුවන් පොලිස් රාජ්‍ය විනයට යටත්වූ සුගම ශ්‍රම වේදිකා සැපයූ තායිවානය හා දකුනු කොරියාව වැනි රටවල් ය. වේගයෙන් වර්ධනය වන කම්කරු පන්තියෙන් නැගෙන ඕනෑම විරෝධතාවක් මැඩ පැවැත්වීම සඳහාත් බලය මත නිලධාරි තන්ත්‍රයෙහි ග්‍රහනය පවත්වාගෙන යෑම සඳහාත් "මහජන ප්‍රජාතන්ත්‍රීය ආඥාදායකත්වය" පවත්වාගෙන යෑමට සීසීපීයට බලකෙරිනි යයි ඩෙං අවධාරනය කලේ ය. වෙසෙස්ව, වැඩ වර්ජනය කිරීමේ අයිතිය 1982 වසරෙහි දී චීන ව්‍යවස්ථාවෙන් ඉවත් කෙරින.

රාජ්‍ය පාලන තන්ත්‍රය එක් අර්බුදයකින් තවත් අර්බුදයකට ඇද වැටුනි. රාජ්‍ය කර්මාන්තවලින් පාලන

නීති රීති ඉවත් කිරීම හා රාජ්‍ය පාලනයට යටත් මිල ගනන් අහෝසි කිරීම අති උද්ධමනයට වේගයෙන් පාර කැපී ය. අසීමිත නිල වංචාව හා මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් නොමැතිකම සම්බන්ධයෙන් පුළුල් ලෙස පැතිරුනු කෝපය සමග සංයෝජනය වූ ජීවන තත්වයන් පිරිහීම, 1982 වසරෙහි දී සමාජීය පිපිරුමක් දියත් කලේ ය. කම්කරුවන් හා ශිෂ්‍යයින් විසින් දියත් කරන ලද පොදුජන විරෝධතා අවසන් වූයේ ටියනන්මන් චතුරස්‍රයෙහි කුරිරු ලෙස කරන ලද දැඩි මිලිටේරි ප්‍රහාරයෙන් පමනි.

සෝවියට් සංගමය මෙන් චීන රාජ්‍ය තන්ත්‍රය ද කඩා වැටෙනු ඇතැයි යන අලුත් බිය මධ්‍යයේ ආර්ථික ප්‍රතිසංස්කරන වේගවත් කරන ලෙස ඩෙං ඉල්ලා සිටී ය. එමගින් ඔහු අපේක්ෂා කලේ කම්කරු පන්තියට එරෙහිව අවරෝධකයක් ලෙස මධ්‍යම පන්තිය ශක්තිමත් කිරීමට ය. කම්රුවන් අතර නොසන්සුන්කම මැඩ පැවැත්වීම සඳහා රාජ්‍ය තන්ත්‍රය අවශ්‍ය ඕනෑම දෙයක් කිරීමට සූදානමින් සිටින බවට සලකුනක් ලෙස ගෝලීය සංස්ථා ටියනන්මන් චතුරස්‍රයෙහි සමූලඝාතනය අර්ථකථනය කරත්ම, චීනය තුලට විදේශීය ප්‍රාග්ධනය ගලා ආවේ ය.

කම්රු ජනතාව සනසාලීමට වඩවඩාත් විකාර රූපී ප්‍රයත්නයක යෙදෙමින් මතවාදීව ඩෙං 1949 වසරේ විප්ලවයට හා "සමාජවාදයට" ඇති සම්බන්ධය පවත්වාගෙන ගියේ ය. වැඩිදුර ප්‍රතිසංස්කරන සාධාරනීකරනය කිරීම සඳහා "ධනවාදය සතුව සැලසුම්කරනය ඇතිවාක්" මෙන් "සමාජවාදය සතුව වෙලඳපොල ඇති බව ද" ඔහු ප්‍රකාශ කර සිටියේ ය. යථාර්ථය වූයේ ලොව වටා වෙනත් රාජ්‍ය තන්ත්‍රයන් මෙන් චීන තන්ත්‍රය ද සතුව තිබුනේ සිය ආර්ථිකය සම්බන්ධයෙන් එන්න එන්නම අඩුවන පාලනයකි. චීනය සරල ආකාරයෙන් යෝධ ජාතික මායිම් ඉක්මවූ සංස්ථා සඳහා දල සටහන්. අමුද්‍රව්‍ය, කොටස් හා ප්‍රාග්ධනය සපයා ජාත්‍යන්තරව භාන්ඩ අලෙවි කල කොටස් ඒකරාශී කරන වේදිකාවක් වූවා පමනි.

චීනය, 1997-98 වසරවල ආසියානු මූල්‍ය අර්බුදයෙහි කම්පනය අවශෝෂනය කලේ, විශේෂයෙන් එක්සත් ජනපදය තුල ව්‍යාප්තවන වෙලඳපොලවලට වඩවඩාත් අපනයනය කිරීමෙන් සමාජීය පිපිරුමක් නිර්මානය නොකර රාජ්‍ය ව්‍යවසාවලින් කම්කරුවන් මිලියන 30 ක් රැකියාවලින් ඉවත ලෑමට අපනයන උත්පාතය තුලින් චීන තන්ත්‍රයට හැකියාවක් ලැබුනි. ධනවාදයේ විසංවාද, කිසිදු හානිකර ප්‍රතිඵලයකින් තොරව නොසලකා හැරිය හැකි යයි ඩෙං අනුව යමින් සීසීපීයේ නිලධාරීහු විශ්වාස කලහ. එසේ වුව ද අද දින වන විට එම විසංවාදයන් අලුත් වටයකින් යලි තහවුරු වී ඇත.

වර්ධන අනුපාතික දිගින්දිගට ම පහත වැටෙත්ම සමාජීය එදිරිවාදිකම් වේගයෙන් වර්ධනය වෙමින් පවතී. 1989 වසරින් පසුව විශාලත්වයෙන් මහත් සේ වර්ධනය වූ බීජිං තන්ත්‍රය හා කම්කරු පන්තිය අතර පරතරය දැන් කිසි දිනකට වඩා පැහැදිලිව පෙනෙන්ට ඇත. සීසීපීයේ සරල ආකාරයෙන් පුලල් ලෙස දර්ශනය වන්නේ පොදු ජනයාට අවාසි වන අන්දමට සුපෝෂනය වී ඇති කොටස්වල ආරක්ෂකයා ලෙස ය. දිගු කලක් තුල පැවති ඉහල ආර්ථික ප්‍රගමනයෙහි අවසානය තම දේශපාලනමය සුජාතභාවෙහි අන්තිම බිඳත් කුඩු පට්ටම් කරනු ඇතැයි සීසීපීයේ නායකයෝ හොඳින් අවබෝධ කරගෙන සිටිති. මේ සුජාත භාවය රැඳී පැවතියේ ධනවාදය සියල්ලන්ම දුගී භාවයෙන් මුදා ගනු ඇතැයි යන මුලාව මත ය. 30 වසරක වෙලඳපොල ප්‍රතිසංස්කරන සලකුනු කිරීම සඳහා මන්දගාමීව පැවතුනු උත්සව නිරූපනය කරන්නේ ඊ ලඟට කල යුත්තේ කුමක් ද යන්න ගැන සලකා බලන කල ඔවුන් තුල ඇති දේශපාලනමය ව්‍යාකූලභාවය හා බිය ය.